# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය
எனது இல DSD/HO/05/MF/BR/05
My No

ඔබේ අංකය
உமது இல ..........................................
Your No

දිනය
திகதி 2026. 01. 02
Date

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුමප්‍රාදේශීය ලේකම්වරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරුවන් හා
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් වෙත.

**<u>2026 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම, වාර්ෂික මහ සභා රැස්වීම් හා නිලවරණ පැවැත්වීමේ කටයුතු පිළිබඳවයි.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් DSD/HO/05/MF/BR/05 සහ 2025.11.26 යොමු කර ඇති ලිපියට අතිරේක වශයෙනි.

02. 2017 මාර්තු මස 07 දින නිකුත් කල 2009/08 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සෑම වසරකම මාර්තු 31 දිනට යටත් පිරිසෙන් දින 30 කට ප්‍රථම (නියෝග අංක 5(6) යටතේ) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ලියාපදිංචිය අළුත් කළ යුතුය.

03. 2026 වර්ෂයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචි අළුත්කිරීම කඩිනමින් අවසන් කල යුතු බවට උපදෙස් ලැබී ඇති බැවින් ලියාපදිංචි අළුත්කිරීමේ අයදුම්පත් ජනවාරි මස එවීමට කටයුතු කල යුතුය. ඒ අනුව මහසභා රැස්වීම් කඩිනමින් පැවැත්වීම සිදු කර සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචි අළුත් කිරීමේ අයදුම්පත් අදාල බැංකු සමිති මගින් 2026 ජනවාරි මස 31 දිනට පෙර අනිවාර්යයෙන්ම යොමු කල යුතු බව අවධාරණය කරමි.

04. පෙර වසරවල මෙන් සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචියට අදාල මුදල (රු.1000/-) සමෘද්ධි බැංකු සමිතිය මඟින් රැස්කර **එක් චෙක්පතක්** මගින්, <u>"කළමනාකරු ලංකා බැංකුව, බත්තරමුල්ල සමෘද්ධි ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන ගිණුම" ජංගම ගිණුම් අංක 3417925</u> ට බැර වන සේ ලියා දින 60 කට වලංගු වන පරිදි සටහන් තබා ලියාපදිංචි අයදුම්පත් සමඟ යොමු කළ යුතු බවද කාරුණිකව දන්වමි.

05. මෙහිදී සමෘද්ධි බැංකු නිලවරණය නොපැවැත්විමේ හේතුව මත සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අලුත් කිරිම සඳහා වන අයදුම්පත්‍ර යොමු කිරිම කිසිසේත් ප්‍රමාද නොකළ යුතුය. පසුගිය වර්ෂවල ඇතැම් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මගින් යොමු කරන අයදුම්පත්‍ර නිසි පරීක්ෂාවකින් තොරව එවීම මත විවිධ අඩුපාඩු පැවතීමත්, ඇතැම් ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති මගින් යොමු කරන අයදුම්පත්‍ර මාර්තු මාසයෙන් පසුව එවීමත් සිදු කර ඇත.

06. මෙම කරුණු සැලකිල්ලට ගෙන ලියාපදිංචි අළුත් කිරීමේ අයදුම්පත්‍රය හා ඒසමග යොමු කල යුතු ලිපි ලේඛණ නියමිත පරිදි අත්සන් කර එවීමටත් නිවැරදිව තොරතුරු ඉදිරිපත් කිරීමත් කල යුතු වේ. නියමිත කාලය තුල නිවැරදිව ඉදිරිපත් නොකරන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමත් ලියාපදිංචි සහතිකය ලබාදීම සිදු කල නොහැකි වන බවත් වැඩිදුරටත් දන්වමි.

සි.ඩි. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |